මාධ්‍ය නිවේදනය අංක 10

# මැතිවරණ කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

2022 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන සකස් කිරීමේ කාර්යය මේ දිනවලදී සිදු කරමින් පවතී.

2021 ඡන්ද හිමි නාමලේඛනය යථාවත් කිරීම පමණක් මෙවර සිදු කරනු ලබන බැවින් ග්‍රාම නිලධාරීන් විසින් ගෙයින් ගෙට සංගණන ආකෘති බෙදාදීමක් සිදු නොකෙරේ. ඡන්දහිමි නාමලේඛනයට 2022 වර්ෂය සඳහා අළුතින් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබා ඇති තැනැත්තන්ගේ විස්තර ගෘහ මූලිකයා විසින් ග්‍රාම නිලධාරී වෙත භාරදිය යුතුවේ.

2004.01.31 දින හෝ ඊට පෙර උපන් සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන් මෙවර ඡන්දහිමියන් ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන බැවින් එවැනි තැනැත්තන් පිළිබඳව විස්තර ග්‍රාම නිලධාරීන් වෙත ලබා දෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව ජනතාවගෙන් ඉල්ලා සිටී.

2022 වර්ෂයේ සිට අවුරුදු 18 සම්පූර්ණ කරන සියළුම තැනැත්තන් මාස 04 කට වරක් පරිපූරක ඡන්දහිමි නාම ලේඛනයට ඇතුළත් කිරීම තුළින් ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයට අන්තර්ගත කරනු ලැබේ .

අවුරුදු 16 - 18 අතර ශ්‍රී ලාංකික පුරවැසියන් පිළිබඳ විස්තර ( 2006.01.31 ට පෙර උපන් ) ග්‍රාම නිලධාරීන්ට හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලබාදීමට කටයුතු කිරීම මඟින් ඉදිරියේදී නිකුත් කිරීමට නියමිත පරිපූරක ඡන්දහිමි නාමලේඛන වලට ඇතුළත් කරගත හැකි බවද අවධාරණය කෙරේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත,
රාජගිරිය.
2022.05.05